**8. ශීර්ෂය 6 – රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

**8.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

කොමිෂන් සභාව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බැව් නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය |
| --- | --- |
| ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| පරිගණක, පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳ ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |

**8.2 විගණන සාක්ෂි නොවීම**

කුවිතාන්සි ආදී වූ අවශ්‍ය සාක්ෂි කොමිෂන් සභාවේ කාර්යාලයේ නොතිබීම නිසා එකතුව රු.768,811 ක මුදලකට අදාල වූ ගනුදෙනු 11 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කළ නොහැකි විය.

**8.3 විසර්ජන ගිණුම**

**අයවැය විචලනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

( අ ) වැය විෂයයන් 11 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 8.26 සිට සියයට 60.44 දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 94(1) ප්‍රකාරව සළසා තිබුණු ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වලට එළඹීම නොකළ යුතු වුවත්, කොමිෂන් සභාවේ කාර්යාලය විසින් වැය විෂයයන් දෙකක් සඳහා සළසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කළ පසු ඉතිරිය රු.89,743 ක් වුවත්, එය රු.188,211 කින් ඉක්මවා එකතුව රු.277,954 ක බැරකම්වලට එළඹ තිබුණි.

**8.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂය අංක 00601 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරික්ෂාවේදි පහත සඳහන් අඩුපාඩු නිරික්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු සේවය හැර ගිය නිලධාරියෙකුගේ ණය ශේෂය රු.32,000 ක්වූ අතර, එම හිඟහිටි ශේෂය වර්ෂ 10 කට අධික කාලයක සිට පැවත එමින් තිබුණද, 2014 දෙසැම්බර් 31 දින වන විටත් එම ශේෂය නිරවුල් කිරීමට කාර්යාලය අපොහොසත් වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී 54 දෙනෙකු වෙත ගෙවා තිබුණු එකතුව රු.5,164,103 ක ආපදා ණය වෙනුවෙන් මුද්දර ගාස්තු අයකර නොතිබුණි.

(ඇ) රජයේ නිලධාරින්ට දෙනු ලබන වැටුප් ණය අත්තිකාරම් වෙනුවෙන් ඇපවීම් පිළිබඳ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පවත්වා නොතිබුණි.

## 8.5 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය
-------------------------------------------

### 8.5.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම
----------------------------

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කොමිෂන් සභා කාර්යාලය විසින් 2014 දෙසැම්බර් 31 දින වන විටත් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

### 8.5.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම
----------------------------------

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම 2014 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

### 8.5.3 විගණන හා කළමනාකරණ කමිටුව
-----------------------------------------

2009 ජුනි 06 දිනැති අංක ඩීඑම්ජ්/2009(1) දරන විගණන හා කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටුව වර්ෂයකට හතර වරක් රැස්විය යුතු වුවත්, එය සමාලෝචිත වර්ෂයේදී රැස්වීම් වාර දෙවරක් පමණක් පවත්වා තිබුණි.

## 8.6 වත්කම් කළමනාකරණය
---------------------------

කාර්යාලයේ වාහන සම්බන්ධයෙන් සිදු කළ නියැදි පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) මුදල් රෙගුලාසි 802(8) ප්‍රකාර කොමිෂන් සභා කාර්යාලය සතු වාහන මිලදී ගත් දිනය, වටිනාකම, අළුත්වැඩියාවන්, නිෂ්කාර්යව පැවැති කාලය ආදි තොරතුරු ඇතුළත් ලේඛනයක් පවත්වා නොතිබුණි

(ආ) කොමිෂන් සභාව සතු වාහන සම්බන්ධයෙන් වාහන ලොග් පොත් යාවත්කාලීන කර පවත්වා නොතිබුණි.

(ඇ) කොමිෂන් සභාව සතු සංචිත වාහන සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 1646(1) ප්‍රකාර දෛනික ධාවන සටහන් හා මාසික සංසිද්ධි වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) මුදල් රෙගුලාසි 1647(ආ) ප්‍රකාරව වාහන සම්බන්ධයෙන් වාර්ෂික සමීක්ෂණයක් කර ඒ පිළිබඳ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

(ඉ) 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව සෑම වාහනයක් සම්බන්ධයෙන්ම මාස 06 කට වරක් ඉන්ධන දැවීමේ පරීක්ෂණය කර නොතිබුණි.

## 8.7 කළමනාකරණ දූර්වලතා

කොමිෂන් සභාවේ 2014 පෙබරවාරි මාසයේ විදුලි බිල්පත ප්‍රමාද වී ගෙවීම නිසා පොලී වශයෙන් රු.9,419 ක් ගෙවා තිබුණි.

## 8.8 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 43 | 32 | 11 |
| (ii) | තෘතියික මට්ටම | 08 | 06 | 02 |
| (iii) | ද්විතියික මට්ටම | 96 | 78 | 18 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 48 | 37 | 11 |
| (v) | වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | - | 01 | (01). |
| | එකතුව | 195 | 154 | 41 |